**සංක්ෂේපයෙන්..................,**

මෙම අධ්‍යයනයේ මූලික අභිප්‍රාය වූයේ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර ලාභී ගුරුවරුන්ගේ ගුරු කුසලතා පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමය. මෙහිදී පෙර පාසල් අධ්‍යාපන සහතික වැඩසටහනෙන් ලත් කුසලතා පිළිබඳව එම ගුරුවරුන්ගේ සංජානන, එමගින් ඔවුන් ලත් කුසලතා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට යොදාගන්නා ආකාරය, එම කුසලතා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීමේදී ඇතිවන ගැටලු සහ එම ගැටලු අවම කර ගැනීමට ඔවුන් යෝජනා කරන පිළියම් පර්යේෂකයා විසින් විමසීමකට ලක් කරන ලදී.

මෙම පර්යේෂණයට හසුකරගන්නා ලද්දේ ශ්‍රී ලංකා විවෘතවිශ්ව විද්‍යාලයයේ මහනුවර ප්‍රාදේශීය අධ්‍යාපන මධ්‍යස්ථානයෙන් පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර ලැබූ පෙර පාසල් ගුරුවරුන් අතරින් තෝරාගත් ගුරුවරුන් පමණි.

මෙම අධ්‍යයනයේ සුවිශේෂී අරමුණු වූයේ:

1. පෙර පාසල් ගුරුවරියක සතුවිය යුතු කුසලතා හඳුනා ගැනීම.
2. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර වැඩසටහන මඟින් පෙර පාසල් ගුරුවරුන් තුළ සංවර්ධනය කිරීමට අපේක්ෂිත කුසලතා හඳුනා ගැනීම.
3. එම වැඩසටහන හැදෑරූ ගුරුවරුන් තුළ එමඟින් තමා ලබාගත් කුසලතා පිළිබඳව පවතින සංජානන අනාවරණය කර ගැනීම.
4. ඔවුන් තමා ලත් කුසලතා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදා ගන්නේ කෙසේ දැය සොයා බැලීම
5. එම කුසලතා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීමේදී මුහුණ පාන ගැටළු අනාවරණය කර ගැනීම
6. එම ගැටළු අවම කර ගැනීමට ඔවුන් ඉදිරිපත් කර ඇති පිළියම් විමසා බැලීම.

මෙහිදී විස්තරාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ පර්යේෂණ උපකරණ වශයෙන් ප්‍රශ්නාවලියක් සහ නිරීක්ෂණය යොදා ගැණින. ප්‍රශ්නාවලියේ මූලික අරමුණ වූයේ පෙර පාසල් ගුරුවරුන් ඔවුන් ලත් පුහුණුවෙන් ලැබූ කුසලතා පිළිබඳව ඔවුන්ගේ සංජානන විමසා බැලීම, සහ එම කුසලතා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියට යොදා ගැනීමේදී ඔවුන් මුහුණ දෙන ගැටලු සහ ඒවා අවම කර ගැනීමට යෝජනා කරන පිළියම් පිළිබඳව විමසා බැලීමයි. නිරීක්ෂණය යොදා ගනු ලැබුවේ පෙර පාසල් ගුරුවරුන් ඔවුන් ලත් කුසලතා ඉගෙනුම්-ඉගැන්වීම්

ක්‍රියාවලියට යොදා ගන්නා ආකාරය විමසා බැලීමටයි. නිරීක්ෂණය සිදු කරන ලද්දේ පර්යේෂකයා විසින්මය. මේ සඳහා මාස තුනක කාලයක් ගතවිය.

මෙම පර්යේෂණය සඳහා ගුරුවරුන් 100ක නියැදියක්ද පෙර පාසල් තුනක ගුරුවරුන් පස් දෙනෙකුද තෝරා ගැණින.

මෙම පර්යේෂණ උපකරණ මගින් ලබාගත් දත්ත හා තොරතුරු අනුව ශ්‍රී ලංකාවේ විවෘත විශ්ව විද්‍යාලයීය පෙර පාසල් අධ්‍යාපන සහතික පත්‍ර ලාභී ගුරුවරුන් එම වැඩසටහනෙන් ඔවුන් ලබාගත් කුසලතා ප්‍රශස්ත මට්ටමකින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී යොදා නොගන්නා බවත් එසේ යොදා නොගැනීමට හේතුද ඒවා අවම කිරීමට යෝජනා කරන පිළියම්ද අනාවරණය කර ගැනීමට හැකි විය. එමෙන්ම තමා පුහුණුව ලද වැඩසටහනෙන් ලැබූ කුසලතා පිළිබඳව බහුතරයක් ගුරුවරුන් සෑහීමකට පත්වන නමුදු එම වැඩ සටහනේ ප්‍රායෝගික පුහුණු කාල සීමාව, සෞන්දර්යය ආශ්‍රිත ක්‍රියාකාරකම්, ප්‍රථමාධාර හා හදිසි ප්‍රතිකාර හා පෙර පාසල් කළමනාකරණය පිළිබඳව ලබාගත් කුසලතා සම්බන්ධයෙන් ඔවුන් සෑහීමකට පත් නොවන බවද අනාවරණය විය.